සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

**9 ශ්‍රේණිය** | **චිත්‍ර කලාව - I** | **කාලය පැය 01 යි**

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.

---

## I කොටස

- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා දී ඇති ප්‍රශ්නවලට පහත දැක්වෙන රූප සටහන උපයෝගී කරගෙන පිළිතුරු සපයන්න.



01. මෙම ඡායාරූපයෙන් දැක්වෙන්නේ කුඩා චෛත්‍යයක් වට කොට තනන ලද ලංකාවේ ඉදි වූ මුල් ම ............................................................................. කි.

02. මෙහි කුලුණු නිර්මාණය කිරීම සඳහා ....................................................................... මාධ්‍ය භාවිතයට ගෙන ඇත.

03. සියුම් කැටයමින් යුත් මෙම කුලුණු හිස්මත ....................................................................... තනා තිබූ බව සඳහන් වේ.

04. මෙහි දැක්වෙන චෛත්‍යය ............................................................................. නමින් හැඳින් වේ.

05. මෙම චෛත්‍යය ගර්භයේ වර්තමාන හැඩය වන්නේ .......................................................................හැඩය යි.

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා එය යටින් ඉරක් අඳින්න.

06. ගජසිංහ රූපය, හේරුන්ඩ පක්ෂියා, ඇත් කඳ ලිහිණියා යන රූප අයත් වන්නේ,

(1) අනුරාධපුර යුගයට ය. (2) පොළොන්නරු යුගයට ය.
(3) කොළඹ යුගයට ය. (4) මහනුවර යුගයට ය.

07. ලංකාවේ හොඳම වාහල්කඩ දක්නට ඇත්තේ,

(1) මහනුවර මාලිගාවේ ය. (2) අනුරාධපුර බිසෝමාලිගයේ ය.

(3) කොළඹ යුගයට ය. (4) මිහින්තලේ කණ්ඨක චෛත්‍යයේ ය.

08. නිදහස හා ආරක්ෂාව ලබා දීම සංකේතවත් කරන, වැළමිටෙන් අත නවා ඉදිරියට දක්වා ඇති ආකාරය හැඳින්වෙන මුද්‍රාව වන්නේ,

(1) වරද මුද්‍රාව (2) අභය මුද්‍රාව (3) විතර්ක මුද්‍රාව (4) භූමි ස්පර්ශ මුද්‍රාව

09. බුදු පිළිමවල දක්නට ඇති පුටුවක හිඳගත් ආකාරයක් දැක්වෙන ආසන ක්‍රමය වන්නේ,

(1) පද්මාසන ක්‍රමය යි. (2) වීරසන ක්‍රමය යි. (3) භද්‍රාසන ක්‍රමය යි. (4) වජ්‍රාසන ක්‍රමය යි.

10. හින්දු කෝවිලවල ඉහල දක්නට ඇති සුවිශේෂී කලා අංගය වන්නේ,

(1) අල්තාර ය. (2) ගෝපුර ය. (3) මිනාර් ය. (4) ශිකරය ය.

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර සපයන්න.**

11. ඇත් හිසක් සහ සිංහ ශරීරයක් යොදා ගනිමින් නිර්මාණය කර ඇති සාම්ප්‍රදායික මෝස්තරය කුමක් ද?

..........................................................................................................................

12. පංති කාමරයේ දී ඇඹීම පුහුණුවීම පහසුවෙන් භාවිත කළ හැකි මාධ්‍ය කුමක් ද?

..........................................................................................................................

13. පන් කර්මාන්තයේ යෙදී සිටින ශිල්පීන් හැඳින්වෙන්නේ කුමන නමින් ද?

..........................................................................................................................

14. එකලැස් කිරීමේ කලාව යනු කුමක් ද?

..........................................................................................................................

15. ද්විතීක වරණ සාදාගන්නේ කෙසේ ද?

..........................................................................................................................

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ඇති පින්තූරයට ගැලපෙන නාමය වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**


(ගුරුළුරාක්ෂ, භේරුණ්ඩ පක්ෂියා, යාලිරුව, සැරපෙන්දියා, කොරවක්ගල, මුරගල)








16 ............................................ 17 ............................................ 18 ............................................





19 ................................................ 20 ................................................

- **ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ යොදන්න.**

21. පොළොන්නරුව සඳකඩ පහනේ සත්ත්ව රූප අතර ගව රුව ද දැකිය හැක. (.............)

22. නාරිලතා මල සම්මත සැරසිළිවලට අයත් කාන්තා රූපයක් සහිත මෝස්තරයකි. (.............)

23. නිල් වර්ණය උණුසුම් වර්ණවලට අයත් වේ. (.............)

24. ලාක්ෂා යනු ඝන ලෝහයකි. (.............)

25. ආයක, ආයික යන නම් වලින් හඳුන්වන්නේ වාහල්කඩ ය. (.............)

- **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා දැක්වෙන වචනවල අර්ථය පැහැදිලි වන සේ වාක්‍ය බැගින් ලියන්න.**

26. සකපෝරුව - ........................................................................................................

27. සාදිලින්ගම් - ........................................................................................................

28. අල්තාරය - ........................................................................................................

29. අංග රචනය - ........................................................................................................

30. පායම් පැහීම - ........................................................................................................

- **පහත දැක්වෙන පින්තූර ඇසුරෙන් ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා ප්‍රශ්නවලට අදාළ පිළිතුරු සපයන්න.**


F


G


H


I


J

31. F අක්ෂරයෙන් දැක්වෙන ශෛලීගත නාට්‍යය නම් කරන්න.

..........................................................................................................................

32. G අක්ෂරයෙන් දැක්වෙන්නේ කිනම් යුගයකට අයත් සඳකඩ පහනක් ද?

.......................................................................................................................................

33. H අක්ෂරයෙන් දැක්වෙන කලා නිර්මාණය දක්නට ඇති ස්ථානය කුමක් ද?

.......................................................................................................................................

34. I අක්ෂරයෙන් දැක්වෙන ශිල්පියා නිම කරනු ලබන කලා නිර්මාණයේ ශිල්ප ක්‍රමය කුමක් ද?

.......................................................................................................................................

25. J අක්ෂරයෙන් දැක්වෙන කලා නිර්මානය සඳහා භාවිතකොට ඇති මාධ්‍යයන් මොනවා ද?

.......................................................................................................................................

- **පහත ඡායාරූපයෙන් දැක්වෙන කලා කෘතිය හඳුනාගෙන එම කලා කෘතිය සම්න්ධව අසා ඇති ප්‍රශ්න අංක 36 - 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



36. මෙහි දක්නට ඇති කලා කර්මාන්තය ............................................................................ නමින් හැඳින්වේ.

37. ඉහත දැක්වෙන නිර්මාණයන් සිදුකරනු ලබන ශිල්පීන් හඳුන්වන්නේ .............................................................. යන නමිනි.

38. මෙම ශිල්ප ක්‍රමය යොදාගනු ලබන්නේ .......................................................................... භාණ්ඩවල මතුපිට සැරසිලි කිරීම සඳහා පමණි.

39. භාණ්ඩ සැරසිළි කිරීමේ දී නියපොතු වැඩ සහ ........................................................................... ලෙස ශිල්ප ක්‍රම දෙකකි.

40. වර්තමානය වන විටත් මෙම කලා කර්මාන්තය වඩාත් සක්‍රීයව දක්නට ඇත්තේ ................................................ ප්‍රදේශ ය.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP


දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

9 ශ්‍රේණිය | චිත්‍ර කලාව - II | පැය 1/2

නම/ විභාග අංකයඃ

- ආදර්ශය චිත්‍රය හා ශාලාධිපති උපදෙස්

- සිසුන්ට ලබා දී ඇති ද්‍රව්‍ය සම්පිණ්ඩනය පැන්සලෙන් පමණක් ඇඳීම සඳහා උපදෙස් ලබා දෙන්න.
  (භාණ්ඩයන් හි ප්‍රමාණය, හැඩ,මතුපිට ස්වභාවය හා පර්යාවලෝකනය පිළිබඳ සැළකිලිමත් වන ලෙස දැනුවත් කරන්න.



**විසඳුම් පත්‍රය**

**ලකුණු දීමේ නිර්ණායක**

01. රේඛා අධ්‍යනය. (ල. 04)
02. ද්‍රව්‍ය සමූහය තලය මත අර්ථවත් ව සංරචනය කිරීමේ හැකියා. (ල. 04)
03. සිද්ධාන්ත භාවිතය. (ත්‍රිමාණ ලක්‍ෂණ, පර්යාවලෝකනය, ඇස් මට්ටම, අවකාශය භාවිතය.) (ල. 04)
04. වර්ණ භාවිතය හා ගතිලක්ෂණ දැක්වීම. (ල. 04)
05. පසුතලය ඇතුළු සමස්ත නිමාව (ල. 04)

(සම්පූර්ණ ලකුණු 20)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

9 ශ්‍රේණිය | චිත්‍ර කලාව - III | කාලය පැය 01 යි

නම/ විභාග අංකය:

- ඔබේ විභාග අංකය හා අදාළ ප්‍රශ්න අංකය උත්තර පත්‍රයේ පිටු පිටේ සඳහන් කරන්න.
- ''අ'' කොටසින් හෝ ''ආ'' කොටසින් හෝ ''ඉ'' කොටසින් එක් මාතෘකාවක් පමණක් තෝරා ගනිමින් වර්ණවත් එක් චිත්‍රයක් පමණක් නිර්මාණය කරන්න.

''අ'' කොටස - ප්‍රකාශන චිත්‍ර

01. නගරයේ ඉරිදා පොළ.

02. වන සතුන් නැරඹීමට ගිය විදේශිකයින් පිරිසක්

03. නිවසේ උපන්දින සාදයක්.

''ආ'' කොටස - මෝස්තර චිත්‍ර

04. ස්වභාවික හැඩ යොදා ගනිමින් චීත්ත රෙද්දක් සඳහා සුදුසු වර්ණවත් නිර්මාණාත්මක ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කරන්න. (8 × 8)

05. ජාමිතක හැඩතල ඇසුරින් සරම් වාටියකට සුදුසු වර්ණවත් මෝස්තරයක් නිර්මාණය කර වර්ණ ගන්වන්න.

06. කුඩ රෙද්දක් සඳහා සාම්ප්‍රදායික මෝස්තර ඇසුරින් වර්ණවත් මෝස්තරයක් නිර්මාණය කරන්න.

''ඉ'' කොටස - ග්‍රැෆික් චිත්‍ර

07. ''ඩෙංගු මාරයා පරදවමු.'' මැයෙන් මහ ජනතාව දැනුවත් කිරීම සඳහා වර්ණවත් පෝස්ටරයක් නිර්මාණය කරන්න.

08. බුදු තෙමඟුල සැමරෙන වෙසක් දිනයට ආසිර පතා කලාත්මක වෙසක් සුභ පැතුම් පතක් නිර්මාණය කරන්න. (දිග අඟල් 6 × 4 ප්‍රමාණයෙන් විය යුතුය.)

09. අලුතින් වෙළඳපලට හඳුන්වා දෙන බීම වර්ගයක් සඳහා සුදුසු නිර්මාණාත්මක ලේබලයක් සැළසුම් කර වර්ණ ගන්වන්න.

## පිළිතුරු පත්‍රය - I කොටස

01. වටදාගෙයකි. 02. ගල් / ශෛලමය 03. පියස්සක් / වහළයක් 04. ථූපාරාමය
05. සණ්ටකාර ය. 06. 4 07. 4 08. 2 09. 3 10. 2 11. ගජසිංහ
12. මැටි 13. කින්නර 14. විවිධ ද්‍රව්‍ය එකතු කොටගෙන එක් නිර්මාණයක් කිරීමයි.
15. මූලික වර්ණ දෙකක් සමව ගෙන එක්කොට සාදාගන්නා වර්ණයයි. 16. යාලි රූව 17. මුරගල
18. කොරවක්ගල 19. හේරුණ්ඩ පක්ෂියා 20. ගුරුළුරාකෂ
21. ✗ 22. ✓ 23. ✗ 24. ✗ 25. ✓
26. කුඹල් කර්මාන්තයේ නියලෙන්නන් මැටි භාණ්ඩ තැනීම සඳහා භාවිත කරනු ලබන්නේ සකපෝවරුව යි.
27. අතීත ශිල්පීන් රතු වර්ණය සාදාගැනීම සඳහා යොදාගෙන ඇත්තේ සාදිලින්ගම් ය.
28. කිතුණු දේවස්ථානවල පූජාසනය අල්තාරය ලෙස හැඳින්වේ.
29. අදාළ චරිතයට හා භූමිකාවට ගැලපෙන පරිදි මේකප්, රැවුල්, කෝණ්ඩා යනාදියෙන් වේෂ නිරූපණය කිරීම අංග රචනය යි.
30. වෙස් මුහුණු සෑදීමේ දී ලී කොටයේ ගැට සහිත තැන් කපා සකසා ගැනීම පායම් පෑහීම යි.
31. සිංහබාහු 32. අනුරාධපුර 33. ගඩලාදෙණිය 34. වාත්තු කිරීම
35. ගොක්කොළ, පොල්කොළ, කෙසෙල් පිති, හබරල කොළ 36. ලාක්ෂා 37. හංගිඩියන්
38. දැවමය 39. පට්ටල් වැඩ 40. මතලේ හපුවිද

## III පත්‍රය

**ලකුණු දීමේ නිර්ණායක**

### (අ) කොටස - ප්‍රකාශන චිත්‍ර

| | | |
|---|---|---|
| 01. | තෝරාගත් මාතෘකාවට අනුව ප්‍රකාශ කිරීමේ හැකියාව | (ල. 08) |
| 02. | රේඛා හැඩතල ඇසුරෙන් මානව රූ ඇතුළු සියළු හැඩතල සම්පිණ්ඩනය කර ඇති ආකරය | (ල. 08) |
| 03. | සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය (පරිමාණය, පර්යාවලෝකනය, ත්‍රිමාණ ලක්ෂණ, ඇස් මට්ටම් හා අවකාශ භාවිතය) | (ල. 08) |
| 04. | වර්ණ භාවිතයේ දක්වා ඇති කුසලතාව | (ල. 08) |
| 05. | අනුගමනය කර ඇති ශෛලීය හා සමස්ත නිමාව | (ල. 08) |

(සම්පූර්ණ ලකුණු - 40)

### (ආ) කොටස -මෝස්තර චිත්‍ර

| | | |
|---|---|---|
| 01. | මාතෘකාවට අදාළව නවකතාවයකින් යුතුව සැලසුම් කිරීම. | (ල. 08) |
| 02. | පාරිභාරික අවශ්‍යතාවයන්ට ගැළපෙන බව හා කර්මාන්තයට උචිත බව. | (ල. 08) |
| 03. | රේඛා හැඩතල අර්ථවත්ව යොදා ගැනීමේ හැකියාව | (ල. 08) |
| 04. | උචිත වර්ණ තෝරා ගැනීමේ හා භාවිතයේ හැකියාව | (ල. 08) |
| 05. | විචිත්‍රත්වය, චමත්කාරය හා නිර්මාණයේ සාර්ථකත්වය | (ල. 08) |

(සම්පූර්ණ ලකුණු - 40)

### (ඉ) කොටස- ග්‍රැෆික්

| | | |
|---|---|---|
| 01. | මාතෘකාවට උචිත ලෙස නවතාවයකින් සැලසුම් කිරීමේ හැකියාව | (ල. 08) |
| 02. | වාණිජමය අවශ්‍යතාවයන්ට හා මුද්‍රණයට උචිත බව. | (ල. 08) |
| 03. | රේඛා හැඩතල අර්ථවත්ව යොදා ගැනීමේ හැකියාව | (ල. 08) |
| 04. | උචිත වර්ණ තෝරා ගැනීමේ හා භාවිත කිරීමේ හැකියාව | (ල. 08) |
| 05. | නිර්මාණයේ සමස්ථ නිමාව | (ල. 08) |

(සම්පූර්ණ ලකුණු - 40)

| | |
|---|---|
| I කොටස ලකුණු | = 40 |
| II කොටසට ලකුණු | = 20 |
| III කොටසට ලකුණු | = 40 |
| මුළු ලකුණු | = 100 |